# ස්වර්ණ කර්කටක ජාතකය

තවද බැලූ බැලුවන් ඇස් නිමවන මනහර රූ අති සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ආනන්ද ස්ථවිර අරහයා මේ ජාතකය දක්වන ලද

ඒ කේසේද යත්

එක් දවසක් දම්සභාවේ රැස්වූ භික්ෂූන් වහන්සේ ආනන්ද ස්ථවිරයෝ සර්වඥයන් වහන්සේ මරන්ට එන්නාවූ ධනපාලයා ඉදිරියේ සිට ජීවිත පරිත්‍යාග කළෝ වේදැයි කිය කියා වැඩ උන් ප්‍රස්ථාවට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා ඒපවත් අසා දැන් මතු නොවෙයි මහණෙනි පෙරත් ජීවිත පරිත්‍යාග කළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

රජගහ නුවර සාලින්දිය නම් ගම බෝධිසත්වයෝ බ්‍රහ්මණ කුලයක ඉපද වාසය කරන්නාහූ දාසක් කිරියෙහි ඇවිදි ගොයම් බලන්නා හා ගොයම් බලා ඒ කුඹුරු අසා පොකුණෙහි ඇස මූන සෝදන්නා හා ඒ පොකුණෙහි රන්වන් කකුළුවෙක් වාසය කරන්නේය. බෝධිසත්වයෝ කකුළුවා ඉනලාගෙණ කුඹුරට ඇවිද ගෙට යන කල පොකුණට ඇර යන්නාහ. ඒ කිරියෙහි එක් තල්ගසක් උඩ වාසය කරන්නාවූ එක් කැවිඩියක් තමාගේ කවුඩාට කියන්නී මේ බ්‍රහ්මණයාගේ පස්පැදිස්නාවූ ඇස් සඟල මට උපුටා දෙව, ඒ නොලදින් නම් මාගේ ජීවිතය නොලබම් කිව. එවිට කපුටුවා කියන්නේ නොමළා තැනැත්තවුගේ ඇස්දෙක කෙසේ උපුටා දෙම්දැයි කියාත් නො වළකින හෙයින් ඒ තල්ගස සමීපයෙහි තුඹුසෙක වාසය කරන්නාවූ නයෙකු ඒ දොළ පසිඳ මැනවැයි කිව. යහපතැයි ගිවිස පසු බෝධිසත්වයෝ කෙත්වත් බලන්ට යන්නාහූ පොකුණට බැස ඇස මුන සෝධා රන්වන් කකුළුවානන් උත්තර සාටකයෙහි ලා එන්නාවූ බෝධිසත්වයන් සර්පයා තන අස්සේ සැඟවී බලා වැද හෙව පාදපිට දෂ්ටකොට තමා වැදොත්තාවූ තුඹසට පළා ගියේය. බෝධිසත්වයෝ විෂ මූර්ඡාවෙන් වැටී උන්නහ. බෝධිසත්වයෝ වැටීමත් කකුළුවා බිමපිට පීනිමත් කපුටුවා බෝධිසත්වයන්ගේ ඇස්දෙක උපුටන්ට ඇවිත් ලයමත්තෙහි ඉඳිමත් එක්ෂණයෙහි ම විය. කකුළුවානෝ මේ කාරණය දැක මුන් නිසා මාගේ මිත්‍රයානන්ට වූ අලාභයකැ යි සිතා කපුටුවාගේ බොටුව නලින් අල්වා ගෙණ තරකොට මැඩළූහ. එවිට කපුටුවා සර්පයාට කියන්නේ රන්වන්වූ ශරීරයක් ඇත් ශරීරය පිටතින් නික්ම තිබෙන්නාවූ ඇස් ඇති නල දෙකක් ඇති ඇටම සම්කොට ඇත්තාවු ලොම් හට නො ගත්තාවූ කකුළුවෙක් මාගේ බොටුව කතුරකින් මඩිනාක්මෙන් මඩිනේය. මා මරහුට ඇරපියා කොයි ගියාද වහා අවුත් මා ගලවා ගණුවයි සර්පයාට අඬගා කීහ. එවිට සර්ප රාජයා තමාගේ යහළුවා කී බස් අසා පෙණය මහත්කොට සුස්මමින් තමාගේ යහළුවා ගාවට ආය. එවිට කකුළුවා සර්පයාත් අඬුවෙන් ඩැගත. එවිට සර්ප රාජයා කියන්නේ එම්බා කකුළුවානෙනි. තොපට සර්පයන්ගේ මාංශයෙනුත් කම් නැත. කළමනා කවර කාරණයක් නිසා අප දෙන්නා අඬුවෙන් ඩැගතු දැයි විචාළේය. එවිට කකුළුවා කියන්නේ එම්බල මේ පුරුෂයා මාගේ ඉෂ්ට මිත්‍රයාය එසේහෙයින් ඌට පැමිණි මරණය මට පැමිණියා හාත් ශරීරය ඒ කාරණය නිසා කකුළුවාන්ගේ මාංශය නම් ඉතා කුලල්ව මොලොක්ව තිබෙන්නේය. ඒ මාංශය මනුෂ්‍යයෝත් කැමති වන්නාහ. කපුටුවෝත් බිඳකති. මුන් නැතිවිට මටත් බොහෝ උපද්‍රා වන්නේය. එසේහෙයින් මාගේ යාළුවූ බ්‍රහ්මණයානන්ගේ විෂබාන්නා උන් නිර්වාධි කරණ නිසා තොප දෙන්නා  අඬුවෙන් ඇල්විම් කීහ. එවිට සර්පයා උපායක් කියා අපි දෙන්නාම ගැලවී පළායම්හයි සිතා කියන්නේ එම්බා කකුළුවානෙනි. අපි දෙන්නාම ඇර පියන්නා විෂයත් උරාගෙණ පලා යම්ම අපි දෙන්නාම ඇරපියවයි කීහ. එවිට කකුළුවා සිතන්නේ මා වංචාකොට ලා දෙන්නාම ගැළමී පළායන්ට උපායක් සිතූ නියාවේද එසේ නොහරමියි සිතා කියන්නේ කපුටුවා තමාම නොහරිම් තොපත් විෂය ඇරගන්නා විචරට මඳක් ලිහිල් කෙරෙමියි. මාගේ යහළු බ්‍රාහ්මණයානන් නිව්‍යාධි කරවා සිටිවිට තොප දෙන්නා අරම් කියා කවුඩාත් තරකොට ඩැගෙණ සර්පයා මඳක් ලිහිල්කොට විෂය උරාගෙණ බෝධිසත්වයන් නිර්ව්‍යාධිව නැගී සිට කල්හි කකුළුවානෝ සිතන්නාහු මේ දුර්ජනයන් දෙන්නා ඇරපිනම් මත මාගේ යාළුවාට උපද්‍රව වන්නේ වේදැයි සිතා කතුරකින් ඇඹුල දණ්ඩ කපන්නාක්මෙන් කපුටුවාගේ ඉසටියත් නයාගේ ඉසටියක් පොලු ගසා එලූහ. බෝධිසත්වයෝත් මළාවූ නාගයාගේ කඳ ලියක අවුලා තුඹසෙහි ලා කකුළුවානන් එනතුරු පටලාගෙණ පොකුණට ඇර ඉස්සෝධා නාහා ගෙට ගියහ. කකුළුවානන් හා බෝධිසත්වයන් හා එවක්පටන් මිත්‍ර සන්තවය නතරවිය. කැවිඩිත් එතනින් ඔබ්බට ගියහයි වදාරා මේ සව්ර්ණකර්කටක ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කැව්ඩි නම් කිඤ්ඤචිමානවිකාය. කවුඩා නම් දේවදත්ත ස්ථවිරය. නයා නම් වසවර්ති මාරයයා. කකුළුවා නම් සුවාසුදහසක් ධර්මස්කන්ධයට භාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථවිරය. බ්‍රහ්මණව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාල සේක.